ආරක්ෂක අමාත්‍යාංශය

මාධ්‍ය නිවේදනය

ඉන්දියාව සැමවිටම අර්බුදකාරී අවස්ථාවන්හි ශ්‍රී ලංකාව සමඟ ශක්තිමත්ව රුඳෙනු ඇති බව සිය පළමු ශ්‍රී ලංකා සංචාරය අරඹමින් ආරක්ෂක අමාත්‍යතුමා පවසයි

ඉන්දියාව සැමවිටම අර්බුදකාරී අවස්ථාවන්හි ශ්‍රී ලංකාව සමඟ ශක්තිමත්ව රුඳෙනු ඇතැයි ආරක්ෂක අමාත්‍ය ශ්‍රී රාජනාත් සිං මැතිතුමා ප්‍රකාශ කළේය. ඔහු මලෙසෙ සඳහන් කළේ 2026 සැප්තැම්බර් 08 වන දින කොළඹ සිටින ඉන්දීය ඩයස්පෝරාව සමඟ හමුවක් සමඟින් සිය පළමු ශ්‍රී ලංකා සංචාරය ආරම්භ කරමිනි. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සමීප සංස්කෘතික සහ ශිෂ්ටාචාරමය සබඳතා පවතින බව අවධාරණය කළ එතුමා එම සබඳතා ද්විපාර්ශ්වික සම්බන්ධතාවයේ වර්ධනය සඳහා ශක්තිමත් පදනමක් වී ඇති බව සඳහන් කළේය.

ආරක්ෂක අමාත්‍යතුමා ඉන්දියාවේ වේගවත් ආර්ථික පරිවර්තනය ඉස්මතු කර දක්වමින් ඉන්දියාව ලොව වේගයෙන්ම වර්ධනය වන ප්‍රධාන ආර්ථිකයක් බවද ගෝලීය වර්ධනයෙන් 16%කට වැඩි දායකත්වයක් ලබා දෙන බව ද ප්‍රකාශ කළේය. 2014 වසරේදී ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 2ක් වූ ඉන්දීය ආර්ථිකය පසුගිය දශකය තුළ ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 4 පමණ දක්වා දෙගුණයකින් වර්ධනය වී ඇති බව එතුමා ප්‍රකාශ කළේය. ගෝලීය ආර්ථික අභියෝග මධ්‍යයේ ඉන්දියාවේ ආර්ථිකය 2026-27 මූල්‍ය වර්ෂයේ පළමු කාර්තුව තුළ 7.8%කින් වර්ධනය වූ බව එතුමා පෙන්වා දුන්නේය. සාර්ව ආර්ථික ස්ථායිතාවය ඉහළ ගොස් ඇති බව අවධාරණය කළ එතුමා පසුගිය වසර 12 තුළ සාමාන්‍ය උද්ධමනය 4.7%ක් බව ද එයට පෙර කාලසීමාවේ සාමාන්‍ය උද්ධමනය 10-11%ක් පමණ වූ බව ද සඳහන් කළේය.

ඉන්දියාවේ භාණ්ඩ සහ සේවා අපනයන අගය 2014 වසරේ ඩොලර් ට්‍රිලියන 45 සිට මූල්‍ය වර්ෂ 2025-26 වර්ෂයේ රුපියල් ට්‍රිලියන 79 දක්වා ඉහළ ගොස් තිබෙන බව රාජනාත් සිං මැතිතුමා ප්‍රකාශ කළේය. විද්‍යුත් භාණ්ඩ සහ ජංගම දුරකථන නිෂ්පාදනයේ සුවිශේෂී වර්ධනය පිළිබඳව අදහස් දක්වමින් එතුමා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදන වටිනාකම රුපියල් ට්‍රිලියන 1.9 සිට රුපියල් ට්‍රිලියන 11 දක්වා ඉහළ ගොස් ඇති බව ද විද්‍යුත් භාණ්ඩ අපනයනය 700%ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් කෝටි 38,000 සිට රුපියල් ට්‍රිලියන 3 දක්වා ඉහළ ගොස් ඇති බව ද සඳහන් කළේය. “ඉන්දියාව ලොව දෙවන විශාලතම ජංගම දුරකථන නිෂ්පාදකයායි. 2014 වර්ෂයේදී 2ක් පමණක් වූ නිෂ්පාදන ඒකක සංඛ්‍යාව අද වන විට නිෂ්පාදන ඒකක 300කට වැඩි

සංඛ්‍යාවක් දක්වා ඉහළ ගොස් තිබනෙවා. ජංගම දුරකථන නිෂ්පාදන වටිනාකම රුපියල් කෝටි 18,000 සිට රුපියල් ට්‍රිලියන 5.5 දක්වා වර්ධනය වී තිබනෙ අතර ජංගම දුරකථන අපනයන ආසන්න වශයෙන් 163 ගුණයකින් රුපියල් ට්‍රිලියන 2.6 දක්වා වර්ධනය වී තිබනෙවා. වාහන අපනයන වාර්ෂිකව රුපියල් කෝටි 50,000 සිට රුපියල් ට්‍රිලියන 1.20 දක්වා ඉහළ ගොස් තිබනෙවා" යැයි ආරක්ෂක අමාත්‍යතුමා ප්‍රකාශ කළේය.

පසුගිය වසර 12 තුළ ඉන්දියාව ප්‍රධාන රටවල් 8ක් සමඟ නිදහස් වළෙඳ ගිවිසුම් ඇතුළු ගිවිසුම් 38ක් අත්සන් කර ඇති බව පනේවා දුන් ආරක්ෂක අමාත්‍යතුමා 2014 වසරට පෙර නිදහස් වළෙඳ ගිවිසුම් 4ක් පමණක් පැවති බව ප්‍රකාශ කළේය. ඉන්දියා-යුරෝපා සමාගම් නිදහස් වළෙඳ ගිවිසුම 'සියලු ගිවිසුම් අතර ප්‍රධාන ගිවිසුම' බව පැවසූ එතුමා එතුළින් සුවිසල් යුරෝපා සංගම් වළෙඳපොළ සඳහා ප්‍රවේශය විවෘත වන බව ද ඉන්දියාවේ වර්ධනය වන රාජ්‍යතාන්ත්‍රික සහ ආර්ථික හැකියාවන් පිළිබිඹු වන බව ද සඳහන් කළේය.

ශ්‍රී රාජනාත් සිං මැතිතුමා ඉන්දියාවේ ගෝලීය විශ්වාසනීයත්වයේ සහ පෞරුෂයේ සැලකිය යුතු වර්ධනය සඳහා අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ නායකත්වය හේතු වූ බව ප්‍රකාශ කළේය. වසර 12කට පෙර කාලය සමඟ සැසඳීමේදී, දැන් ලෝකය ඉන්දියාව ජාත්‍යන්තර වේදිකාවේ කතා කරන විට සවන් දනෙ බව එතුමා පැවසිය. දරෙටහේ ජනතාව අතර පාලමක් ලසෙ කටයුතු කිරීම සම්බන්ධයනේ එතුමා ඉන්දිය ඩයස්පෝරාව අගය කළේය.

ආරක්ෂක ක්ෂේත්‍රයේ පරිවර්තනය පිළිබඳව අදහස් දක්වමින් ආරක්ෂක අමාත්‍යතුමා වසර 12කට පෙර ඉන්දියාවේ ආරක්ෂක උපකරණ අපනයනය රුපියල් කෝටි 600ක් පමණක් වූ බව සඳහන් කළේය. මේ වන විට එම අගය රුපියල් කෝටි 39,000ක් පමණ දක්වා වාර්තාගත ලසෙ ඉහළ ගොස් තිබනෙ බව එතුමා ප්‍රකාශ කළේය. ආරක්ෂක අයවැය 2013-14 මූල්‍ය වර්ෂයේ පැවති රුපියල් ට්‍රිලියන 2 පමණ සිට 2025-26 වර්ෂයේදී රුපියල් ට්‍රිලියන 7.25 දක්වා ඉහළ ගොස් ඇති බව එතුමා පනේවා දුන්නේය. මමෙ වර්ධනය තුළින් ඉන්දියාවේ පුළුල් වන හැකියාවන් සහ වඩා ශක්තිමත් සහ ස්වයං රදා පැවැත්මක් සහිත ආරක්ෂක ක්ෂේත්‍රයක් වනෙ අඛණ්ඩ ගමන පිළිබිඹු කරන බව එතුමා පැවසිය.

ශ්‍රී රාජනාත් සිං අමාත්‍යතුමා පනේවා දුන්නේ අද වන විට ඉන්දියාව ලොව තවෙන විශාලතම ප්‍රාරම්භක සමාගම් ක්ෂේත්‍රය හිමි රට වන බවයි. 2014 වසරේ සිට රටහේ යුනිකෝන් සමාගම් සංඛ්‍යාව වෝගයෙන් ඉහළ යමින් තිබනෙ බව ද එතුමා සඳහන් කළේය. මතෙුළින් ඉන්දියාවේ තාරුණ්‍යයේ නවෝත්පාදන නැඹුරුව සහ ව්‍යවසායකත්ව ධෛර්යය පිළිබිඹු වන බව එතුමා ප්‍රකාශ කළේය.

බදුකරණයේ සිදු කළ සැලකිය යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳ අදහස් දක්වමින් ආරක්ෂක අමාත්‍යතුමා හාණ්ඩ සහ සේවා බද්ද හඳුන්වාදීම තුළින් 'එක් රටක්, එක් බද්දක්' යන තේමාව මනාව ස්ථාපිත වූ බව සහ බදු සහන පියවර තුළින් බදු ගවේෂණ මත බර අඩු වූ බව ද සඳහන් කළේය.

මහජන සුබසාධනය මත ආර්ථික වර්ධනයේ බලපෑම පිළිබඳව අදහස් දක්වමින් ශ්‍රී රාජනාත් සිං අමාත්‍යතුමා සඳහන් කළේ කෝටි 25ක පමණ ඉන්දියානුවන් පිරිසක් දුගී බවින් මුදවා ගනෙ ඇති බවයි. ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ දකෙහෙම දුගිභාවය තියුණු ලසෙ පහත වැටී ඇති බව සඳහන් කළ එතුමා සමාජ ආරක්ෂණ ආවරණය පුළුල් වී ඇති බව සඳහන් කළේය. 2014 වසරේදී පුරවැසියන් කෝටි 25ක පමණ වනෙ ළඟා වූ සමාජ ආරක්ෂණ වැඩසටහන් මගින් අද වන විට කෝටි 95ක පමණ ඉන්දියානුවන් පිරිසක් ආවරණය කරන බව එතුමා පනේවා දුන්නේය. ඩිජිටල් පොදු යටිතල පහසුකම් හි පරිවර්තනීය බලපෑම ද අවධාරණය කළ එතුමා බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධකතාවය වේගයෙන් පුළුල් වී අති බව ද UPI ගවේෂ පරෙ නොවූ විරූ පරිදි වර්ධනය වී ඇති බව ද පනේවා දුන්නේය.

ආරක්ෂක අමාත්‍යතුමා මහාමාර්ග, ගුවන් තොටුපළ සහ වනෙත් ප්‍රවාහන ජාල පුළුල් කිරීම ඇතුළු ඉන්දියාවේ යටිතල පහසුකම්වල වේගවත් සංවර්ධනය ද ඉස්මතු කර දැක්වීය. ඉන්දිය ඩුම්රිය සේවා 100%ක විද්‍යුත්කරණයක් දක්වා වේගයෙන් ගමන් කරමින් සිටින බව එතුමා සඳහන් කළේය. JAM පද්ධතිය සහ සෘජු ප්‍රතිලාභ ලබා දීමේ යාන්ත්‍රණය මගින් සුබසාධන ප්‍රතිලාභ පුරවැසියන්ට සෘජුවම හිමි වන බව සහතික කරන බව පනේවා දුන්නේය. සෘජු ප්‍රතිලාභ යාන්ත්‍රණය හරහා රුපියල් ට්‍රිලියන 51ක ජනතාවගේ බැංකු ගිණුම්වලට බැර කර ඇත.

ශ්‍රී ලංකා රජයේ කැබිනට් අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මැතිනිය; බස්නාහිර පළාත් ආණ්ඩුකාර හනීෆ් යූසුෆ්; ශ්‍රී ලංකා රජයේ නියෝජ්‍ය අමාත්‍ය සුන්දරලිංගම් ප්‍රදීප්; ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් ශ්‍රී සන්තෝෂ් ජා; ජයෂ්ඨ ඉන්දීය රාජ්‍ය සහ හමුදා නිලධාරීන් සහ ඉන්දීය ප්‍රජාවේ සාමාජිකයන් මමෙ අවස්ථාව සඳහා සහභාගි වූහ.